සන්නස
SANNASA



# වනබිම සැරිසර



නිමල් සේදර

# වෙඩි කෑ කුළාට කැති පහර

ගලෙන් බිඳුනු වැව ප්‍රදේශයේ බොහෝ ගැමියන්ට ගත ලොමු දැගැන්වන සුලු කැලෑ කථා කියන්ට ශක්තියක් තිබේ. වන්නාන්තරය වටකර ගත් ගමේ ඉපදී හැදී වැඩී මියයන ගැමියන්ට සතුන් ගෙනුත්, සතුන්ට ගැමියන් ගෙනුත් සිදුවන අතවර අපමණය. කැලේ එළි පෙහෙළි නොකොට හේන් ගොවිතැන් කළ නොහැකිය. කැලේ නොගොසින් ගෙවල් තැනීමට අවශ්‍ය දැව දඬු සම්පාදනය කළ නොහැකිය.

පදවිය පොලීසියේ කලක් සාජන්වරයකුව සේවය කළ සමරවික්‍රම දැන් ගලෙන් බිඳුනු වැව පදිංචිව සිටී. ඔහු වල් මීහරකෙක් සමග කළ හටන පිළිබඳව අපට කළ විස්තරය ත්‍රාසජනකය. එය සිදු වුයේ මීට වසර දෙකකට පෙර මැයි මස හතර වෙනිදා දවසකයි. ගලෙන් බිඳුනු වැවෙහි පදිංචියට පැමිණි ඔහුට ගෙපැලක් තනා ගැනීමට අවශ්‍යය විය. ඔහු වනාන්තරය දන්නා ගැමියන් දෙදෙනෙකු වන නිමල් සහ රේටී අප්පු සමඟ ලී කපන්නට වනාන්තරයට ගියේය. සමරවික්‍රම මහතා සමග ඔහුගේ වැඩිමහල් පුතාද වනාන්තරයට ගියේය. රේටි අප්පු සහ නිමල් ඉදිරියෙන් ගිය අතර පියා සහ පුතා පසු පසින් ගමන් කළහ.

එක පාරටම අපට ඇහුණා අපට ඉස්සරහිං ගිය මිනිස්සු දෙන්නා කෑමොර දෙනවා. අපි හිටියෙ යාර සීයක් විතර ඈතින් පුතාත් මාත් දුවගෙන ගියා. අපි එක පාරටම හිතුවේ වලහ ගහලා තමයි කියලා. අපි දුවගෙන ගියා. ගිහිං බලන කොට වලහා නොවෙයි කුලා (කුලු මී හරකා) නිමල්ට ඇනලා විසි වෙලා පැත්තක, රේටී අප්පුට ඇනලා, රේටි අප්පු කුලා අන්දෙකට මැදිවෙලා දෑතින්ම අං දෙක අල්ලාගෙන බෙරිහන් දෙමින්, මුට ගහපල්ලා කිය කියා.

එක පාරටම මං දුවගෙන ගිහිං මගේ අතේ තිබුණු කැත්තේ මිටෙන් දෑත බදලා පාරක් ගැහුවා, කැලා රේටි අප්පු පැත්තකට විසිකරලා ඊතලේ වගේ මගේ පැත්තට හැරුණා. පොළොව පහුරු ගාලා, පස් අවුස්සලා ඇදිටිගා ගෙන මගේ දිහාවට පිඹගෙන ආවා. එක පිම්මට. උඹලා ගහ උඩට නැගපල්ලායි මම කෑගැහුවා, ඒ අවස්ථාවේ එදු සිද්ධියට මුහුණ දුන් ඔහුගේ ලොකු පුතාද එතැනට පැමිණියේය. රේටී අප්පුලාත් මගෙ පුතාත් ගස්වලට ගොඩ උනා. මං බලාගෙන, මං දෙපාරක් එහෙට මෙහෙට පැන්නා ඒත් කුලා මගේ ඉස්සරහටම පැන්නා. මග හරින්නට බැරි තරමයි. යෝධ මීමාගේ ඇස් බියකරු පෙනුමෙන් ඉතිරිලා ගිහිං වෙන කරන්නට දෙයක් නෑ. මං කැත්තෙන් දෑත බෙදලා ගැහුවා හරියටම ඔලුව මැදට. පාර කාගෙන ලේ පෙරා ගත්ත කුලා අඩි පහකට වැඩිය පස්සට ගියා පාර කාගෙන උගේ බියකරු පෙනුම එන්ට එන්ටම වැඩි උනා. ආයෙත් කෑගහගෙන පිඹගෙන ඉදිරියට ආවා. ගස් උඩ බලා හිටිය මිනිස්සු මහත්තයෝ පරිස්සමෙන් කියලා කෑගහනවා. ඒ පාරත් මං දෑත බදලා හරියටම ඔලුව මැදට කැතිපාර දුන්නා.

මුලු කැති තලේම ඔලුව ඇතුළට ගියා. පාර කාගෙන මී හරකා ආගිටිගාගෙන කැලේ ට දිව්වා විදුලි සැරේට. මාත් දැන් හොඳටම බය වෙලා. කැත්ත පුරාම ලේ. බිම සේරම අවුල් වෙලා. පස් පහුරුගාලා. අවට මීහරක් ගඳ .

තව එක විනාඩියක් ලතවෙන්ට උනේ නෑ. කොච්චර හරි අපේ අනික් අය නැග්ග ගස් හොයාගන්නත් බැරිවුනා. මී හරකා ආවෙ නැද්ද මට පිටිපස්සෙන් කැලේ චට පට ගාගෙන බිඳගෙන. මං හැරිලා බැලින්නම් මීමා ලේ පෙරාගෙන එනවා. ගස්වල හිටිය පිරිසත් කෑමොර දුන්නා. මීමා දැන් එන්නේ එක්කෝ උඹ නැත්නං මං කියල . මොනව කරන්නද? මගෙත් අත බියෙන් වෙව්ලද්දීම දෑත බදන තුන්වෙනි පාරටත් මං කුලාගෙ හිස් මුදුනට ගැහුවා.

හරියට කොස් ගෙඩියක් කපනවා වාගේ ටකස් ගාසා සද්දේ ඇහුණා. මටත් හරිම හරි දුකයි. ලේ විතරක් නෙවෙයි මොළ කෑලිත් විසිවෙලා ගියා. ඔහු විස්තර කළේ කඳුලු පිරුණ දෙනෙත් ඇතිවය.

ආත්මාරක්ෂාවට මං මටන් කළේ. දවස් දෙකක්ම මං මේ සිද්ධිය නිසා දැඩි සෝකෙන් හිටියා. දැනුත් මේ සිද්ධිය මතක් වෙනකොට මට හරිම කණගාටුයි. සමරවික්‍රම මහතා කීය.

මියගිය කුලා වෙඩි වැදුණු එකෙක් බව පසුව අනාවරණය විය.






